


දැතිගොයියා යනු කමත් ගැහීමේදී ඉතාමත් ප්‍රයෝජනවත් උපකරණයකි. මිනිසෙකුගේ උස තරමට කරුවක් සහිත ලීයක් උපයෝගී කොට ගෙන මෙම උපකරණය සාදා ගනියි. මෙයින් මැඩුවන් හැලීම, කමත පිරිසිදු කිරීම, මැඩුවන් එකතු කිරීම වැනි කාර්යයන් සිදු කරනු ලැබේ. දෙවියන්ගේ කාර්යයක් ලෙස සලකමින් කමත් ගැසීමේදී මැඩුවන් පිඩකට දෑත තැබීම හෝ කරන්නේ බොහෝ ගෞරවයෙන් එයට වැඳීමෙන් පසුව ය. කමතේ හරකුන්ට පෑගී වෙන්වන ගොයම් "මැඩුවන්" වන අතර වී "බැත බෝය" වෙයි. කමත මඩවා අවසානයේ දී සියලු මැඩුවන් (පිදුරු) කමතින් අයින් කොට (පිට කමත් කොට) සියලු ම වී (බැත) කම්බා කණුව මුලට ක්‍රමානුකූලව මුදුන් වන ආකාරයට එකතු කරනු ලැබේ. ඉන්පසු ගෝණිවලට (ගෝණි කටුපන්) පිරවීම කරනු ලබන්නේ ද ඉතාමත් ගෞරවාන්විත ආකාරයකිනි.

වී පිරවීම සඳහා ගෝණි රාශියක් පැත්තක තිබේ. කම්බා කණුව වටා ඇති වී, ගෝණිවලින් වසයි. එක් අයෙක් අත්කටුපන නම් පන්වලින් වියන ලද



විශාල මළු දෙකක් දෙකට නමා ඒවා තම හිස මත තබා පළමුව කම්බා කණුවේ සතර පැත්තට ම හිස පහත් කොට නමස්කාර කරමින් එය වටා තුන් විටක් කරකැවෙයි. ඉන්පසු වසා ඇති වී ගොඩ ළඟින් ඉඳ ගැනීමට පෙර අත්කටුපන් තම ඇඟ වටා තුන් විටක් කර කවයි. පසුව වී ගොඩ ළඟින් වාඩිවෙන ඔහු අත් කටුපන බිම එළා එහි පිටට තම දෑතින් වී පුරවයි. පුරවනු ලබන වී තවෙකෙක් ඔසවාගෙන ගොස් ගෝණියට දමයි. වී ගෝණියට දැමීමට පහසු වනු පිණිස දෙ-දෙනෙක් ගෝණි කට ඇරගෙන සිටිති. මේ ක්‍රියාද-ාමය අවසාන වන තුරු කිසිවෙක් කිසිම වචනයක් වත් කතා නොකරති. කිසියම් අවශ්‍යතාවකට කතා කරන්නට අවශ්‍ය වුවහොත් කරන්නේ හස්ත මුද්‍රාවෙනි.

මෙසේ පුරවන ලද වී ගෝණි එක ළඟ ගොඩක් වන ලෙස එකතු කොට පිදුරුවලින් වසා දමා සියලු දෙනා ම තම නිවෙස් වලට යති. අනුන්ගේ ගොවිපළකින් වී සොරකම් කිරීම වැනි වැඩ කිසි-වෙක් කිසි ම විටක නොකරති. එතරම් ම විශ්-වාසයකින් ගොවිතැන් වැඩ සිදු කෙරෙයි.

ඊට පසුව දිනක වී හුළං කිරීම කරනු ලැබේ. වී හුළං කරනු ලබන්නේ පිරිසිදු කර ගැනීම සඳහා ය. පාවර ගොඩැල්ලේ තරමක් උසට ලීවලින් කතිරයක් බඳිනු ලබයි. එය සාමාන්‍යයෙන් අද කොට්ටා පොර තරඟයට බඳිනු ලබන කතිරයක් වැනි ය. එහෙත් ඊට වඩා බොහෝ උස ය. කතිරය මුදුනේ කෙනෙකුට කකුල් දෙක දෙපසට දමා වාඩි වී සිටීමට හැකි අතර කකුල් දෙක තබා ගැනීම සඳහා ද පහසුකම ඇත. කතිරය යටින් මාගල් එළා ඇත. කතිරය උඩ සිටින අයට වෙන අයෙකු කුල්ලකට දැමූ වී ලබා දෙනු ලබන අතර ඔහු කතිරය මුදුනේ සිට ක්‍රමයෙන් වී මාගලට වැටෙන්නට හරින්නේ වතුර වැක්කෙ-රෙන්නාක් මෙන් ක්‍රමානුකූලව ය. සුළඟට හසුවන පුංචි මැඩුවන් රොඩුබොඩු සහ බොල් වී ඉවතට සුළඟේ පාවී යන අතර හොඳින් කිරි වැදී මේරූ වී පමණක් කතිරය යටට ම වැටෙයි.

"පාවර මැනීම" වී මැනීමයි. අඳ කුඹුරක නම් පසු දිනක කුඹුරු හිමිකරු සහ වගා කරන ගොවියා එක් වී අස්වැන්න මැනීම සිදු කර තම කොටස් වෙන් කර ගනිති. සමහර තැනක පාවර මනින විට කුඹුරු හිමිකරු පැමිණෙන්නේ නැත. එහෙත් කුඹුරු වැඩ කරන ලද ගොවියා ඉතා සාධාරණ ලෙස ඔහුගේ කොටස වෙන් කර නිවසට ම ගෙනැවිත් දෙයි.

වසරකට වරක් ගොවිතැන් කපා පෑගුවාට පසු මල් මඩුවක් නැටීම කීප පළක ම සිදු කෙරිණි. අබිලියන් මාමලාගේ ගෙදර. බයිට් මහත්තයාලාගේ ගෙදර, දවටගහගෙදර දියෝනිස් බාස්උන්නැහේලාගේ ගෙදර සහ අඳ කට්ටියේ මෙම මල් මඩු නැටීම සිදු කෙරේ.

දෙවොල් මඩු ශාන්ති කර්මයකට බොහෝ සේ සමාන මෙම මල් මඩුව මුළු ගමට ම සෙතක් සලසන්නක් බව ගම්මු විශ්වාස කරති. දෙවොල් මඩුවේ මෙන් ම මඩු පේ කිරීම සිදු කරනු ලබන අතර සැන්දෑ කාලයේ සිට එළිවෙන තුරා ශාන්ති කර්මය සිදු කරනු ලැබේ. එක් ස්ථානයක පවතින මල් මඩුව නැරඹීම සඳහා බොහෝ පිරිස එකතු වෙති. මේ සඳහා ප්‍රධාන කපු මහතා වන්නේ පත්තිනි මහතාය. දෙවොල් මඩු, ගම්මඩු මෙන් ම

මල් මඩුව අවසානයේ දී ගරායක් ශාන්තිය සහ දෙවියන්ගේ දානය සිදු කෙරේ. ගරායක් ශාන්තියෙන් පසු දෙවියන්ගේ දානය දෙන අතර සමහර විට ඊට පෙර ද දේව දානය දෙනු ලැබේ. දෙවියන්ගේ දානය සඳහා ගමේ ලොකු පොඩි වැඩිහිටි සියලු පිරිස එක්වෙති. බොහෝ විට

# මල් මඩුවේ ගරා යකා....

මල් මඩු සඳහා ප්‍රධාන වශයෙන් සම්බන්ධ වූ කපු මහත්වරු වූයේ රබලියේ පත්තිනි මහතා සහ සුදු මහතා ය. ප්‍රධාන කපු මහත්වරුන්ගේ නායකත්වය සහ උපදෙස් පරිදි වෙනත් කපු මහත්වරු ද මෙම ශාන්ති කර්ම සිදු කළහ.

මල් මඩුවේ දී දෙවොල් නැටීමේ දී මෙන් ආවේශ වීමෙන් නටන වාහල නැටීම, අඹ විදීම, වඩිගපටුන ආදී ප්‍රධාන නර්තන ඉදිරිපත් නොකෙරන අතර බොහෝ සේ සෙත් ශාන්ති කරනු ලැබේ. ගම්මු ආදරයෙන් කතා කරන ඩොංගා, උක්කුවා, සිරා ආදී නම්වලින් හැඳින්වෙන නැටුම් නටන සහ බෙර වාදනය කරන ශිල්පීන් කීප දෙනා සෑම මඩු පොළක දී ම දැක ගත හැකි ය. තවත් ඔබියස් නම් වූ අයෙක් ද බොහෝ විට මෙම ස්ථානවල අග ඇල්ලීම සඳහා සිටියා මගේ මතකය කියයි. ඔහු ගස් ඔබියස් යනුවෙන් ද හඳුන්වනු ලැබුවේ ඉතා දක්ෂ ලෙස ගස් කැපීමේ කාර්යය ද කළ නිසා ය. අග ඇල්ලීම යනු බොහෝ යාතිකා හා කවි කියන විට ඒවායේ අග තවත් ඇද පැද ගායන ස්වරූපයෙන් ගායනා කිරීම ය. බො-හෝ විට "කොට්ටෝරුවා" නමින් හඳුන්වන අයෙකු ද මෙම ස්ථානවල දකින්නට ලැබේ. ඔහු මල් මඩුවේ දී සිදු කරනු ලබන සියලු ම කාර්යයන් ගැන මනා අවබෝධයක් ඇති අයෙකි. ඒ ඒ වෙලාවට අවශ්‍ය දෑ සැපයීම, පන්දමට තෙල් ගැසීම, පන්දම පත්තු කර දීම, හත් මාළුව පිසීම, අඩුවැඩිය සැපයීම ආදී කාර්යයන් ඔහු අතින් සිදු වේ.

අබිලියන් මාමලාගේ නිවසේ පැවැත්වෙන මල් මඩුවේ දී මෙම කාර්යයන්ට "ඔබියස්" ද නොවරදවා ම සිටි අයෙකි. මල් මඩුවේ දී ගෝතම්බ රොටි යනුවෙන් විශේෂ රොටි වර්ගයක් පුළුස්සා ගැනීම සිදුවේ. හාල්පිටි, සීනි, පොල් සහ කහ එකට අනා කොළපතක ඔතා වළක් තුළ ගසන ලද ගිනි මැළයක අඟුරු තුළට බහා පුළුස්සා ගනී. එය කැබලිවලට කපා සියලු ම දෙනා කෑමට ගැනීමෙන් දේවාශීර්වාද ලබා ගැනීමට හැකි බව අදහති.

පාන්දරින් ම දේව දානය දීමට උනන්දු වන්නේ පාසල් යන ළමයින්ට දානය වැළඳීමෙන් පසු පාසලට යා හැකි බැවිනි.

ගරායක් ශාන්තිය ඉතාමත් විනෝදජනක බො-හෝ පිරිසක් නැරඹීම සඳහා වට වී සිටින ශාන්ති කර්මයකි. නයි පෙණ කිහිපයකින් යුතු ගරා යක් මුහුණ පැළඳ ගත් නර්තන ශිල්පියා නොයෙකුත් විහිළු වදන් පවසමින් තම නර්තනයේ යෙදෙයි. මෙම නැටුම සඳහා ගොරකා ගස් දෙකක බඳිනු ලබන "අයිලය" උපයෝගී කර ගනියි. බෙර වාදන ශිල්පියා සමඟ නර්තන ශිල්පියා දොඩමලු වන අතර සමහර විටක ඔවුන්ගේ දෙපිට කැපෙන වචන නිසා සමහරු බඩ අල්ලාගෙන සිනහවන අවස්ථා ද ඇත. නොයෙකුත් ශිල්ප දක්වමින් නර්තන ශිල්පියා තම කාර්යය ඉටු කරන අතර අවසා-නයේ දී අයිලය ඉතා වේගයෙන් පැද එහි එක් ගොරකා ගසක් බිමට පාත්කර කඩා දමයි. සමහර විටක නර්තන ශිල්පියාට තනියම ගොරකා ගස කඩා දමන්නට බැරි වුවහොත් තවත් අය ද එයට එක් වී කඩා දමනු ලැබේ. අනතුරුව තවත් ඉදිරියට නටමින් මුළු ගෙය සහ වත්ත පුරා ම දුම්මල ගසා මල් මඩු ශාන්ති කර්මය අවසාන කරනු ලැබෙයි.

දේව දානය සඳහා අප සියලු දෙනා ම එළන ලද මාගලක පේළියට වාඩි වී සිටින අතර සෑම දෙන ඉදිරියේ එළනු ලබන කෙසෙල් කොළවලට අලුත් සහල් බත්, හත් මාළුවක් සහ තවත් හාල් මැස්සන් සහිත වූ දිය හොද්දක් ද, හැඳිකැවුම් සහ ඇඹුල් කෙසෙල් ගෙඩි දෙක බැගින් ද බෙදා දෙති. ප්‍රධාන කපු මහතා විසින් කරනු ලබන යාතිකාවකින් පසු දේව දානය වැළඳීමට අවසර ලැබේ. එක් අයෙකු විසින් අල්ලාගෙන යනු ලබන කෙසෙල් පතකට හෝ කොළ පතකට සෑම දෙනා විසින් ම තම ආහාරවලින් පුංචි කොටසක් දැමී-මෙන් අනතුරුව දානය වැළඳීම ආරම්භ කරති. අපි ද මල් මඩුවක් මග නොහරින අතර කිසියම් විටක රාත්‍රියේ දී යාමට නොහැකි වූවත් උදයේ ගරා යකුම බැලීමට සහ දේව දානයට සහභාගි වීම සඳහා නොවරදවා ම යන්නෙමු.

**මතු සම්බන්ධයි**